**පානදුර නගර සභාව - 2023**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පානදුර නගර සභාවේ2023දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාමුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්හ දුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන්උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.28 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී වර්ෂයේ අතිරික්තය ලෙස රු.82,395,207ක් සටහන් කළ යුතු වුවද රු.91,723,943ක් ලෙස සටහන් කර තිබුණු අතර වර්ෂයේ ක්ෂය හා ස්ථාවර වත්කම්විකුණුම් අලාභගැලපීමේදි රු.1,018,930කවෙනසක් ද විය. | ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ඉවත් කොට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා අතිරික්තය නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුයි. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම් හා ගෙවීම් සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හා වත්කම් හා වගකීම් ප්‍රකාශයේ අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණු අතර 2023 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.6,000,000ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් වටිනාකම ලෙස ආදායමට හඳුනාගෙන තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක CA/06/02/DOT/NFC හා 2021 පෙබරවාරි 10 දිනැති ලිපිය මගින් පළාත් පාලන ආයතන විසින් චිත්‍රපට ශාලාවලින් අයකරනු ලබන විනෝද බද්ද වසර 02ක් යනතුරු අය නොකිරීමට තීරණය කර තිබුණද 2022 වර්ෂය සඳහා රු.600,000ක් විනෝද බදු බිල් කිරීම ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | අදාල තීරණය පරිදි විනෝද බදු සඳහා බිල් කිරීම් නොකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යගණන වටිනාකම සහක්ෂය සමග රු. 15,662,931 ක් ප්‍රත්‍යගණන ලාභය ලෙස හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ පූර්ව වර්ෂයේ ගැලපීම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | දුන් වරිපනම් බදු වට්ටම් රු.713,668ක් හුවමාරු ගණුදෙනු වලින් ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. | කලින් දුන් වරිපනම් බදු වට්ටම් නිවැරදිව සටහන් තුල දැක්වීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | පාරවල් බෝක්කු හා පාලම් සඳහා හා පුස්තකාල පොත් සඳහා 2023 වර්ෂයට අදාල ක්ෂය පිළිවෙලින් රු.827,485ක් හා රු.152,851 වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ශුද්ධ පොත් අගයට ක්ෂය ගණනය කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | . |
| (ඊ) | 2023 වර්ෂයේ පරිගණක මෘදුකාංගය ප්‍රත්‍යාගණනය කිරීමේදී රු.405,977ක්වූ සමුච්චිත ක්ෂය ඉවත් කර නොතිබුණු අතර 2023 වර්ෂට අදාල රු.102,539ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයකට අදාළ ශේෂය එයට අදාළ උපලේඛනය සමඟ සැසඳීමේදී රු.3,229,825ක වෙනසක් විය. | හිඟ වරිපනම් බදු ශේෂය ලෙස උපලේඛනවල සඳහන් කර ඇත්තේ හිඟ වරිපනම් අධි ගාස්තු රැස් කිරීමේ ගිණුමේ ශේෂය හා හිඟ වරිපනම් රැස් කිරීමේ ගිණුමේ ශේෂයන් දෙකෙහි එකතුව බව. | වෙනස්කම් වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) හුවමාරු නොවන ගණුදෙනු වලින් ලැබිය යුතු දැ වල වට්නාකමසටහන අනුව රු.183,055,411ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල රු.189,055,410ක් ලෙස රු.6,000,000ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නගර සභා ආඥා පනතේ 164(2) වගන්තිය අනුව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත | සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි හෝටලයකින් ගාස්තු අයකර නොතිබුණු අතර, මුදල තහවුරු කර ගැනීම සඳහා ගිණුම් ප්‍රකාශන ලබාගෙන නොතිබුණි. | ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන බව. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.82,395,207 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.72,451,067 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට හිඟය (රු) | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට හිඟය (රු) |
| වරිපනම් හා බදු | 73,000,000 | 73,248,009 | 57,329,706 | 15,918,303 | 74,860,300 | 77,321,357 | 54,822,971 | 22,498,385 |
| කුලී | 6,621,800 | 7,833,400 | 6,774,668 | 10,171,544 | 10,152,100 | 6,820,587 | 2,747,037 | 4,073,550 |
| බලපත්‍ර ගාස්ථු | 421,000 | 460,000 | 460,000 | - | 1,797,100 | 458,500 | 458,500 | - |
| වෙනත් ආදායම් | 1,660,000 | 1,934,200 | 1,944,150 | 59,140 | 236,078,610 | 1,201,679 | 1,201,679 | - |
| එකතුව | 81,702,800 | 83,475,609 | 66,508,524 | 26,148,987 | 322,888,110 | 85,802,123 | 59,230,187 | 26,571,935 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාල විශ්ලේෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂ ආරම්භයට වරිපනම් හා බදු හිඟය රු.37,826,699ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ඉන් රු.18,226,380ක් හෙවත් සියයට 48ක් අයකර නොතිබුණි.(check) | අයවිය යුතු හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | කාල විශ්ලේෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත වරිපනම් හා බදු හිඟය රු. 39,639,846ක් වූ අතර එකී හිඟය තුල වර්ෂ 1ත් 05ත් අතර රු.35,715,916ක් ද වර්ෂ 05ට වැඩි රු.3,923,930ක් ද වූ අතර,ඉන් රු.50,000 ඉක්මවූ වරිපනම් ඒකක 101කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.10,109,384ක් විය. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා විශේෂ ආදායම් එකතු කිරීමේ වැඩසටහනක් හා දේපල තහනම් කිරීමේ වැඩසටහනක් සිදු කිරීමට කටයුතු යොදා ඇති බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කඩකුළී තොරතුරු වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ වෙළඳ ස්ථාන කුලී එකතු කළ යුතු ආදායම රු.22,202,312ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට සියයට 45ක් වූ රු.9,961,208 ක මුදලක් අයකර ගත යුතුව පැවතිණි. | 2023.12.31 දින වන විට අයකර නොමැති ප්‍රතිශතය 44.87%බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.84,744,229ක් විය. | අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව. | මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩගැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් 2023 වර්ෂය තුලදී ලැබී තිබුණු අයදුම් පත් සංඛ්‍යාව නේවාසික හා ව්‍යාපාරික වශයෙන් පිළිවෙලින් 69ක් හා 06ක් වුවද අනුමත කරන ලද සංඛ්‍යාව පිළිවෙලින් 54ක් හා 03ක් වූ අතර, 2023 දෙසැම්බර් 31 දිනට අනුකූලතා සහතික ලබාදුන් සංඛ්‍යාව නේවාසික වශයෙන් 06ක් පමණක් විය. | අනුමත නොවුණු අයදුම්පත්වල ඇති අඩුපාඩු අයදුම්කරුවන් හට දන්වා ඇති අතර, එම අඩුපාඩු ඔවුන් සකස් කර දෙන ආකාරයට එය නැවත අනුමැතිය සඳහා සැළසුම් කමිටුවලට යොමු කරනු ලබන බව. | අයදුම්පත් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයට පෙර සිට පැවත එන අත්තිකාරම් මුදල් වටිනාකම වූ රු.1,075,318ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කර නොතිබුණි. | පොත් වලින් කපා හැරීමට අනුමැතිය ලබාගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කර ඇති බව. | අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දුම්රියපළ පාර හා මාකට් පාර කඩ කුලී අය කිරීම සඳහා 2018 වර්ෂයේ නව තක්සේරුව ක්‍රියාත්මක නොකර 2017 වර්ෂයේදී අයකළ කුලී මුදලම 2018 වර්ෂයට අය කිරීමට 2018.08.02 දිනැතිව ගෙන තිබූ මහ සභා තීරණය අවලංගු කිරීමටත් 2018.01.01 සිට 2018 වර්ෂයේ නව තක්සේරුව අනුව කඩ කුලී මුදල් අය කිරීමට සහ එදින සිට 2019.12.31 දින දක්වා ගිවිසුම් ගත වීමටත් එදින දින සිට හිඟ කුලී මුදල් අය කිරීමටත් 2019.08.01 දිනැති මහ සභාවේදී අනුමත වී තිබුණි. එහෙත් මෙම යෝජනාවට කඩ හිමියන් අකමැති වීම මත පැරණි තක්සේරුව පදනම් කරගෙන කඩ කුලී අයකරන අතර සභාව විසින් නව තක්සේරුවට අනුව මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුව අනුව හිඟ කඩ කුලී අය කර ගැනීමට මේ වන විට ක්‍රියා මාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 සැප්තැම්බර් 30 දින පෞද්ගලික ආයතනයකින් රු.2,165,000ක මුදලකට ලීටර 9500ක ධාරිතාවක් සහිත ඉන්ධන ටැංකියක් මිලදී ගෙන තිබුණද විගණිත දින වන විටත් ඛණිජ තෙල් සංස්ථාවෙන් තෙල් ඇණවුම් කර ගබඩා කිරීම සඳහා අවසරය ලබාගෙන නොතිබුණි. | එහි අනුමැතිය ලද වහාම ඉන්ධන මිලදී ගැනීම කටයුතු සිදු කරන බව. | තෙල් ටැංකි කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පානදුර මුහුදු වෙරළේ තැබීමට පානදුර නගර සභාවට පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු වැසිකිළි පද්ධතියක් සහිත කන්ටේනර් බහාලුම අළුත්වැඩියා කිරීම සඳහා රු.189,040ක මුදලකට 2020 ජූනි 23 දින පෞද්ගලික ආයතනයකට පවරා දී තිබුණ ද 2020 සැප්තැම්බර් මාසයේදී ව්‍යාපෘතිය තාවකාලිකව නවතා තිබුණි. එහෙත් 2020 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කර නොතිබුණ අතර, මේ වන විට දුම්රියපල පාරේ ගාල් කර ඇති කන්ටේනර් | ඇස්තමේන්තුව නැවත විශ්ලේෂණය සඳහා කර්මාන්ත කමිටුවේ නිර්දේශය මත 2020 .සැප්තැම්බර් 10 දින මහ සභාව මගින් තීරණය කර ඇති බැවින් ජර්නල් දමා ඉවත් කර ඇත. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බහාලුම භාවිතයට ගත නොහැකි ලෙස දිරාපත් වී තිබුණි. | | |
| (ආ) | 2017 වර්ෂ තුළ පෞද්ගලික සමාගමකින් රු.295,000ක් ගෙවා මිලදීගෙන තිබුණු වැටුප් හා මානව සම්පත් කලමනාකරණ මෘදුකාංගය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා නගර සභාවේ කාර්යාල කටයුතු පරිගණක ගත කිරීම සඳහා විෂයන් 07ක් සහිත මෘදුකාංග පද්ධතිය මිලදී ගත් මුදලට අමතරව භාවිතා නොකර සේවා ගාස්තු වශයෙන් 2022 වර්ෂයේදී රු.178,500ක් ද ගෙවා තිබුණි. | සේවා ගිවිසුමේ 5.2 වගන්තිය ප්‍රකාරව සාමාන්‍යයෙන් මෘදුකාංගය අලෙවි කිරිමෙන් පසු මෘදුකාංගයේ මුළු වටිනාකමින් 20%ක ප්‍රමාණයක් සේවා ගාස්තු වශයෙන් වාර්ෂිකව ගෙවිය යුතු නමුත්, එම ආයතනය සපයන සේවාව සඳහා මෘදුකාංගයේ මුළු වටිනාකමින් 5%ක් බැගින් වාර්ෂිකව අයකිරීම සිදු කර ඇති බව හා ලබාගන්නා එක් එක් මෘදුකාංගයේ වටිනාකමට සේවා ගාස්තු ගෙවන්නේ නම් මුළු කොටස් වටිනාකමින් 10%ක සේවා ගාස්තුවක් වාර්ෂිකව අයකරනු ලබන බව අදාල ආයතනයෙන් දන්වා ඇති බවත් ඒ අනුව පද්ධතියේ මුළු වටිනාකමින් 5% මුදලක් සේවා ගාස්තු ගෙවීම අප ආයතනයට වාසිදායක වන බව. | මෘදුකාංග පද්ධතිය කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරය වෙනුවෙන් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.5,293,640ක මුදල් ශේෂය නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව ඵලදායි කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි. | මේ සඳහා 2024 වර්ෂයේදි තන්තිරිමුල්ල පුස්තකාලය බිම් මහල වැඩ නිම කිරීම සඳහා රු.5,000,000ක ඇස්තමේන්තු සකස්කර ආරම්භක පියවර සිදුකර ඇති අතර,ඒ සඳහා 2024 අප්‍රේල් 08 දින නාගරික සංවර්ධන අධිකාරියට නගර සංවර්ධන ගිණුමේ ඇති මුදල් මේ සඳහා නිදහස් කරදෙන ලෙස දන්වා ඇති බව. | නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව ඵලදායි කාර්යයන් සඳහා යොදා ගත යුතුය. |
| (ඈ) | පානදුර නගර සභාව සතු ඉඩම් 6ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් සම්බන්ධයෙන් අයිතිය කියා පෑම සඳහා ගැටළු ඇති වී ඇති අතර මේ වන විට ඒ පිළිබඳව නිරවුල් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | සභාව සතු ඉඩම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.4,750,971ක් වන අතර, අයකර ගත නොහැකි හා විස්තර නොදන්නා ණය ශේෂ රු.521,639ක් විය. 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,274,706ක් ද, විශ්‍රාම නිළධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,745,121ක් වන අතර මියගිය හා සේවය හැරගිය නිළධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,209,505ක් විය. | හිඟ ගිණුම් ශේෂ අයකර ගැනිමට කටයුතු කරමින් පවති | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පානදුර නගර සභාවේ 2023 වර්ෂයේ අයවැය ලේඛනය මගින් පුනරාවර්තන නොවන වියදම් සඳහා රු.8,919,200ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අයවැය ලේඛනය හා සැසදීමේදි වියදම සියයට 24 ක් එනම් රු.2,166,445ක් පමණක් විය. | ණයහිමි සඳහා මෙම ඉතිරි මුදල් වෙන්කර ඇති බව. | අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |